**කල්පිටිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 11 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලංකා බැංකුවෙහි ආයෝජනය කර තිබුණු රුපියල් මිලියන 20ක ස්ථාවර තැන්පතුවට අදාළව සමාලෝචිත වර්ෂයේ දින 132ක් වෙනුවෙන් ලැබිය යුතු පොලී රු.710,992ක් ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාලසීමාවට තැන්පත් මුදලට ලැබිය යුතු පොලිය වන රු.710,992ක් 2019 වර්ෂයට ගිණුම්ගත කිරීම අතපසු වී ඇති බැවින්, එය මෙම වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 08කට අදාළව ඉදිරිපත් කළ උපලේඛනයත්, උපයෝගී පොත් අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර නොසැසඳීම් වල එකතුව රු.2,098,788ක් විය. | ශේෂයන්හි ඇති වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේදී එම වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 09ක එකතුව රු.124,613,031ක් වූ අතර ඒ අතරින් වසර 05 ඉක්මවූ ලැබිය යුතු ශේෂය රු.10,799,670ක් විය. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කඩිනම් පියවර ගනු ලබන අතර අයකර ගත නොහැකි ඒවා අනුමැතිය මත කපා හැරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 08ක එකතුව රු.92,299,220ක් වූ අතර ඒ අතරින් වසර 05 ඉක්මවූ රු.7,442,826ක ශේෂයක්ද විය. | ගෙවිය යුතු වියදම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු මුදල් තොරතුරු ලබාගෙන ගෙවීමටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල් වාරික වශයෙන් ගෙවීමටත් කටයුතු කරන බව දන්වමි. |

**(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.618,262,514ක් වූ ගිණුම් විෂයයන් 07ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | නියමිත ආකෘතියට අනුව සකස් කළ ලේඛන හා ඉඩම්වලට අදාළ පැවරුම් ඔප්පු ආදිය ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i)129(2) (ඊ) වගන්ති | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු බදු කුලී, කඩ කුලී විධිමත් පරිදි | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ | බදු කුලී හා කඩ කුලී අයකර ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු කරන ලෙස |

| | | | | |
|---|---|---|---|---|
| | | ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | යුතු වේ. | නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව දන්වමි. |
| | (ii)136 වගන්තිය | සභා සීමාව තුල පිහිටි සභාවට අයත් බදු දෙන ලද හෝ කුලියට දෙන ලද දේපළ සම්බන්ධයෙන් වූ වරිපනම් සහ අක්කර බදු ආදායම් බිල්කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සභාව සතු දේපළවලද වරිපනම් තක්සේරුව සිදු කර ඇති අතර, එම දේපළ බදු දී ඇති බදුකරුවන්ගෙන් වරිපනම් බදු අයකරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව දන්වා සිටිමි. |
| | (iii)158 වගන්තිය | වරිපනම් හා අක්කර බදු හිඟ මුදල් අයකර ගැනීම සඳහා එම බදු ගෙවිය යුතු අයගේ චංචල හා නිශ්චල දේපළ තහනමට ගෙන හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. මේ වන විට අදාල නීතිරීති අනුව අවශ්‍ය කටයුතු කරන ලෙසට විෂය භාර නිලධාරී හට උපදෙස් ලබා දී ඇත. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) අංක 33 රීතිය | දේපළ තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තුව අවසානයේදී පිළියෙල කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කඩිනමින් කටයුතු කළ යුතු වේ. | දේපළ තහනම් කිරීමේ වරෙන්තු කාර්තුවක් අවසානයේදී පිළියෙල කර ඉදිරිපත් කරන ලෙසට දැනුම් දී ඇත. |
| | (ii) අංක 65 රීතිය | ගෙවීම් සඳහා ඉඩදී තිබෙන කාලසීමාව අවසානයේදී ගෙවීම පැහැර හරින තැනැත්තන්ගේ නාම ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කඩිනමින් කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කරන ලෙසට අදාළ අංශ භාර නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ගෙවීම් පැහැර හරින තැනැත්තන්ගේ නාම ලේඛනයක් සභාව වෙත ඉදිරිපත් කර ඇත. |

(ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u>

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 371(ඇ) | 1989 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුල ලබාගත් රු.229,658ක් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අයකර ගත හැකි අත්තිකාරම් මුදල් වෙතොත් ඒවා අයකර ගැනීමට හෝ එම කාලය තුලදීම පියවා, නියමිත පරිදි ලේඛනගත වී නොමැති අත්තිකාරම් වේ නම් කමිටු නිර්දේශ මත කටයුතු කරන බව දන්වමි. |
| (ii) මුදල් රෙගුලාසි 571(2) | රු.458,857ක් වූ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් තටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කොන්ත්‍රාත් සමිතීන් වෙත ලිඛිතව දැනුම්දීමක් කර දින 14ක කාලසීමාවක් තුල ඉදිරිපත් නොවන සියළුම සමිති හා තැන්පත්කරුවන්ගේ තැන්පත් මු.රෙ.571ට අනුව අරමුදලට බැර කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. |
| (iii) මුදල් රෙගුලාසි 1646 | 2019 වර්ෂයේදී සභාව සතු වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශවල මුල් පිටපත විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ධාවන සටහන් මුල් පිටපත් ඉදිරියේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබාදී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,362,687ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,068,615ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,168 | 1,831 | 720 | 11,622 | 2,225 | 3,204 | 1,739 | 10,521 |
| කුලී | 12,014 | 9,468 | 9,493 | 7,154 | 10,968 | 10,056 | 8,643 | 7,179 |
| බලපත්‍ර ගාස්තු | 2,200 | 1,719 | 1,736 | 43 | 4,136 | 2,607 | 2,607 | 60 |
| වෙනත් ආදායම් | 105,121 | 93,992 | 55,546 | 41,411 | 96,116 | 91,566 | 48,143 | 43,424 |
| | 120,503 | 107,010 | 67,495 | 60,230 | 113,445 | 107,433 | 61,132 | 61,184 |

*රැස්කළ ආදායම තුල වර්ෂයේ බිල්කළ ආදායමෙන් රැස්කළ ආදායම සහ හිඟහිටි ආදායමෙන් රැස්කළ ආදායමද ඇතුලත්ව තිබේ.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මුළු බිල්කළ ආදායම රු.107,010,699ක් හා සමාලෝචිත වර්ෂය ආරම්භයේදි පැවති හිඟය රු.61,184,871ක් වූ අතර, වර්ෂය තුලදී බිල්කළ ආදායමෙන් හා හිඟ ආදායමෙන් රු.67,495,765ක් රැස්කර තිබුණි. ඒ අනුව වර්ෂය තුළ සමස්ත ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 40 ක් පමණ විය. | වාර්ෂිකව බිල්කළ ආදායම් වර්ෂය තුලදීම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ වරිපනම් බදුවලින් සියයට 50ක් මෙම වසරේදී අයකර ගැනීමටත් සමීක්ෂණයට අනුව අක්කර බදු අයකර ගැනීමටත් ජල නල පද්ධතිය නවීකරණය කර නිසි පරිදි ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කිරීමට නියමිතය. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උපයෝගී ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.10,208,256ක් වූ අතර, එම හිඟය තුල වර්ෂ 01ට වැඩි හා වර්ෂ 05ට අඩු රු.3,999,130ක්ද වර්ෂ 05ට වැඩි රු.5,168,617ක්ද විය. | අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වසර 20කට පසු 2010 වර්ෂයේදී වරිපනම් ප්‍රතිශෝධනයක් කිරීම හේතුවෙන් ඉඩම්වල තක්සේරු වටිනාකම් ශීඝ්‍ර ලෙස ඉහළ යාම මත වරිපනම් බද්ද වැඩිවීම මත ඇතිවූ ගැටළු සහගත තත්ත්වය නිසා ඊට විකල්පයක් වශයෙන් හිඟ වරිපනම් බද්ද කොටස් වශයෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

**2.2.4 අක්කර බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උපයෝගී ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමියන්ගෙන් අයවිය යුතු රු.914,168ක අක්කර බදු හිඟයක් වූ අතර එම හිඟයෙන් රු.506,555ක් අවුරුදු 05කට වැඩි හා රු.407,613ක් අවුරුදු 01ත් 05ත් අතර කාලයකට අදාළ විය. | ලේඛන යාවත්කාලීනව පවත්වා ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට මෙම අක්කර බදු සමීක්ෂණය සඳහා කණ්ඩායමක් පත් කර ඇති අතර හිඟ මුදල්ද සමග අක්කර බදු අයකර ගැනීමට උපදෙස් ලබාදී ඇත. |

**2.2.5 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උපයෝගී ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී හා බදු කුලීවල එකතුව රු.7,154,484ක් වූ අතර එම හිඟයෙන් රු.4,643,995ක් අවුරුදු 05කට වැඩි හා රු.1,530,689ක් අවුරුදු 01ත් 05ත් අතර කාලයකට අදාළ විය. | අයවිය යුතු ආදායම් කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | කඩ කාමර කුලී තක්සේරු කටයුතු සිදුකර ඇති අතර නව ගිවිසුම්වලට එළඹීමට පෙර හිඟ මුදල් අයකර ගැනීමට උපදෙස් ලබාදෙන ලදී. හිඟ මස් කඩ කුලී අයකර ගැනීමට හෝ නීතිමය කටයුතු කිරීමට නොහැකි තත්ත්වයක පසුවන බව දන්වමි. |

**2.2.6 බලපත්‍ර ගාස්තු**

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1980 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ව්‍යාපාරික ස්ථාන 61කින් අයවිය යුතුව තිබුණු රු.42,735ක් වූ හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි. | වෙළඳ බලපත්‍ර නිසි කලට අයකර ගැනීම අදාළ නිලධාරීන්ගේ වගකීමක් බැව් අවධාරණය කළ යුතුවේ | එම හිඟ මුදල් අයකර ගැනීමට නොහැකි තත්ත්වයක පවතින බැවින් ඒවා ලේඛනවලින් කපා ඉවත්කිරීම සඳහා වයඹ පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට ඉදිරිපත්කර ඇත. |

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.28,149,051ක් හා උසාවි දඩ රු.7,050,203ක් විය. | අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු ලබා ගැනීම සඳහා වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීමක් කර ඇති අතර, ශේෂ සනාථ කිරීමේ ලිපි මේ වන විටත් ලැබී ඇත. ලැබිය යුතු මුද්දර ගාස්තු වලින් රුපියල් මිලියන 12ක මුදලක් මේ වන විට ලැබී ඇත |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා 42ට අමතරව සභාව විසින් නව අතුරු ව්‍යවස්ථා 12ක් වැළඳගෙන තිබුණු අතර යෝජිත අතුරු ව්‍යවස්ථාවක් අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි. | අදාළ අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කළ යුතු වේ. | එකඟවෙමි. සභාව විසින් සකස් කළ අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසු ගැසට් කිරීම සිදුකල අතර තවදුරටත් අවශ්‍යවන අතුරු ව්‍යවස්ථා සකස් කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙසට පළාත් පාලන දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| | | මගින් පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනයෙන් ඉල්ලීමක් කර ඇත. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| "එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේදී එයට අනුගත වී තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට සැලසුම් ක්‍රියාත්මක කළ යුතු වේ. | අරමුණු සපුරා ගැනීමට ප්‍රතිපාදන වෙන්කර එය ආංශික සැලසුම්වල ක්‍රියාකාරකම්වලට ඇතුළත් කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විනෝද බදු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවක් පනවා ගතයුතු වේ. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී. අදාළ අනුමැතිය ලැබීමෙන් අනතුරුව එම බදු පැනවීමේ නියෝගය ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට දායකය ලෙස රු.1,992,035ක මුදලක් ගෙවිය යුතුව තිබුණද සභාව එම මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ගෙවියයුතු වටිනාකම් හඳුනාගෙන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවීම කඩිනමින් සිදුකළ යුතු වේ. | විශ්‍රාම වැටුප් අරමුදලට දායක ලෙස රු.1,992,035ක මුදලක් ගෙවිය යුතු නමුත්, ඒ සම්බන්ධව තොරතුරු ලබා දෙන ලෙස 2019.05.13 දිනැති ලිපියෙන් ඉල්ලුම් කර ඇත. එසේම 2019.06.11 දින පැවති මහා සභා රැස්වීමටද මෙම හිඟ මුදල ගෙවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසද ඉදිරිපත් කර ඇත. |
| (ඇ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ලබාදී තිබූ කොඩි කණු 464න් රු.147,344ක් වූ කොඩි කණු 115ක් ඉකුත් වර්ෂවලදී බාහිර පාර්ශව වෙත ලබාදී තිබුණු අතර, එම කොඩි කණු හෝ එහි | අස්ථානගතවීම් සම්බන්ධයෙන් නීති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වත්කම් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කළ | සභාවේ මන්ත්‍රීවරුන්ට හා වෙනත් අයට ලබාදෙන ලද කොඩි කණු 115 අදාළ තොරතුරු කිසිවක් නොමැති බැවින් ඒවා අයකර ගැනීමට නොහැකි වී ඇති බවත් 2017 හා 2018 වර්ෂවල අස්ථානගත වී |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම මුදලින් හෝ ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2017 වර්ෂයේදී කොඩි කණු 31ක්ද 2018 වර්ෂයේදී කොඩි කණු 62ක්ද අස්ථානගත වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | යුතු වේ. | ඇති කොඩි කණු 93ට අදාළව ගබඩා භාරකරුගෙන් කණු වටිනාකම හා සියයට 25ක රජයේ ගාස්තුද අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු වැට් බදු මුදල් නිසි පරිදි නොගෙවීම හේතුවෙන් රු.1,477,252ක දඩ මුදලක් සභාව වෙත පනවා තිබුණි. | වැට් බදු මුදල් නිසි පරිදි නොගෙවීම පිළිබඳව වගකිව යුත්තන්ගෙන් කරුණු විමසිය යුතු අතර රජය පනවන බදු මුදල් ගෙවීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ ලේකම්තුමා විසින් අදාළ ආයතනය සමග සාකච්ඡා කිරීමෙන් පසු, දඩ මුදල් කපා හැරීමට අවශ්‍ය කටයුතු කරන බවටත් එම වැට් බදු මුදල 2020 වර්ෂයේ අවසන්වීමට පෙර කොටස් වශයෙන් ගෙවා නිම කරන ලෙසටත් දැනුම් දී ඇත. ඒ අනුව අදාළ බදු මුදල් දඩ මුදලක් නොමැතිව මෙම වර්ෂය අවසන්වීමට පෙර ගෙවා අවසන් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා ලේකම් තනතුර වසර ගණනාවක සිට පුරප්පාඩු වී පැවති අතර ද්විතියික ශ්‍රේණියේ නිලධාරීන් 04ක හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 06ක පුරප්පාඩු පැවතුණි. | සේවක පුරප්පාඩු විධිමත් ලෙස පිරවීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ ලේකම් තනතුර වසර ගණනාවක සිට පුරප්පාඩුව පවතින අතර, ද්විතියික ශ්‍රේණියේ නිලධාරි පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට යොමු කර ඇති අතරම, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂම මගින් බඳවා ගැනීම් සිදු කරන බවද දන්වා එවා ඇත. එසේම ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 06ක පුරප්පාඩු සඳහා බඳවා ගැනීමටද යොමු කර ඇති බව වැඩිදුරටත් දන්වමි. |
| (ආ) | අයවීමට ඇති සේවක ණය - 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.6,435,113ක් වූ අතර, එයින් විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා මිය ගිය සේවකයින් 54 දෙනෙකුගෙන් අයවිය යුතු | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අයකර ගැනීමට නොහැකි මුදල් පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු | විශ්‍රාම ගොස් ඇති හා සේවය හැර ගොස් ඇති නිලධාරීන්ට ලිඛිතව දැනුම් දී ඇති මුත් කිහිපදෙනෙකු හැර අනෙක් අයගේ පදිංචිය වෙනස්කම් නිසා දැනුම්දීමට නොහැකි වී ඇති අතර මිය ගිය සේවකයින්ගේ ණය මුදල් අයකර ගැනීම කිසිදු |

| | | | |
|---|---|---|---|
| | රු.120,244ක් වූ ණය ශේෂය වර්ෂ 05කට වැඩි කාලයක සිට හිඟව පවතින අතර අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි. | වේ. | වාර්තාවක් නොමැතිවීම මත අයකර ගැනීම ගැටළුවක් වී ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට ලැබී තිබුණු අනතුරුදායක ගස් පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් නියමිත කාලය තුල සේවාලාභීන් වෙත සේවා සැපයීමට සභාව අපොහොසත් වී තිබුණි. | අදාළ නීතිරීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ සිට විගණනය මගින් දැනුම් දී ඇති රාජකාරි කටයුතුවල ප්‍රමාදයන් වළකා ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුල පිහිටි ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කර ගැනීම, එම සංවිධානවල වත්කම් වගකීම් අධික්ෂණය සභාව විසින් සිදු කළ යුතු වුවත් එවැනි අධීක්ෂණයක් සිදුවන බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර බල ප්‍රදේශයේ පිහිටි ප්‍රජා මූල සංවිධාන 22කින් සභාවේ ලියාපදිංචි වී තිබුණේ සංවිධාන 06ක් පමණි. | නීතිරීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙතෙක් ලියාපදිංචි වී නොමැති ප්‍රජා මූල සංවිධානවල පිහිටි පානීය ජල ව්‍යාපෘති ඉදිකිරීම, දීර්ඝ කිරීම හා නඩත්තු කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා නොදීමට සභාව මගින් නිර්දේශ කර ඇති අතර, ලියාපදිංචි කිරීමෙන් අනතුරුව අදාළ ජල ව්‍යාපෘතිවලට වාර්ෂික බලපත්‍ර ලබාදීමටත් ඒවායේ වත්කම් හා වගකීම් සම්බන්ධව අධීක්ෂණ කටයුතු මහා සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මගින් තීරණයක් ගෙන සභාවට පවරා ගැනීම සම්බන්ධව ඉදිරි කටයුතු කරන ලෙසට විෂය භාර නිලධාරි වෙත උපදෙස් ලබා දී ඇත. |
| (ඇ) | ප්‍රදේශයේ එක් එක් මාර්ගයේ දැනට සවිකර ඇති පහන් වර්ගය, වොට් ගණන අනුව ලේඛනගත කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණු අතර වීථි පහන් අළුත්වැඩියාවේදී භාවිතා නොකරන ලද භාණ්ඩ ආපසු භාරගැනීම හා භාවිතා කළ නොහැකි ඉවත් කළ උපාංග | ලේඛනගත කිරීම් කඩිනම් කළ යුතු වේ. | සභා බල ප්‍රදේශය තුළ සවි කර ඇති සියළුම වීථි පහන් අංකනය කර ලේඛනගත කිරීමේ කටයුතු මේ වන විට කරමින් පවතින අතර, ඉදිරි කාලසීමාව තුල එහි වැඩ කටයුතු අවසන් කිරීමට හැකි බව දන්වමි. |

ආපසු භාරදීමට අදාළ නියමිත ආකෘති භාවිතා කරමින් ලේඛන නඩත්තු කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව විනාශ කළ හා විකුණූ භාණ්ඩ තොග ලේඛනවලින් හා ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතු වේ. | එකඟවෙමි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය වාර්තාවට අනුව වෙන්දේසි සඳහා යොමු කරන ලද භාණ්ඩ තක්සේරු මුදලට ලබාගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවූ බැවින් භාණ්ඩ වෙන්දේසි නොවීය. එබැවින් එම භාණ්ඩ තොග ලේඛනවලින් හා ගිණුම්වලින් ඉවත් කර නොමැති අතර, විනාශ කරන ලද භාණ්ඩ පමණක් තොග ලේඛනයෙන් ඉවත් කර ඇත. මෙම වර්ෂයේදී සිදුකරන ලද සමීක්ෂණ වාර්තාවට අනුව අදාළ භාණ්ඩ තොග ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ගබඩා භාරකරු භාරයේ පැවති ප්‍රොජෙක්ටර් යන්ත්‍රය අස්ථානගත වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | අදාළ පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | සභාව සතු ප්‍රොජෙක්ටර් යන්ත්‍රය ප්‍රජා සංවර්ධන අංශය මගින් වැඩසටහනකට රැගෙන ගොස් එහිදී අස්ථානගත වීමක් සිදුවී ඇත. අදාළ යන්ත්‍රයේ වටිනාකම හා එයට අදාල 25%ක රජයේ ගාස්තුව ගෙවන ලෙස ප්‍රජා සංවර්ධන අංශයේ අංශ ප්‍රධානී වෙත දැනුම් දීමක් කර ඇත. නොගෙවන්නනේ නම් ඇයගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.5.3 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කල්පිටිය ප්‍රාදේශීය සභාව සතු වෙළඳ සංකීර්ණය, සති පොල, පොදු ක්‍රීඩා පිටි, ළමා උද්‍යාන, පෙර පාසල්, පුස්තකාල, සුසාන භූමි, බස් නැවතුම්පොල පොදු වැසිකිළි හා ප්‍රජා ශාලා ඇතුළු වත්කම් (ඉඩම් හා ගොඩනැගිලි) 60ක් පවරාගෙන නොතිබුණි. | අදාළ පවරා ගැනීම් කඩිනමින් කළ යුතු වේ. | මෙතෙක් සභාවට නොපවරාගත් සභා සතු ගොඩනැගිලි සහිත ඉඩම් පවරා ගැනීම සඳහා විස්තරාත්මක වාර්තාවක් ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලය වෙත යවා ඇති අතර, ඊට අදාළව වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින්ද තොරතුරු විමසා අදාළ ආයතනය වෙත යැවීමට කටයුතු කර ඇත. |

## 4. ශිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කර එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියට නියමිත පරිදි ලබා දෙන ලද උපදෙස්වලට අනුව සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරන ලෙසට ලිඛිතව නියෝගයක් ලබා දී ඇත. |